# සබරගමු මහ සමන් දේවාලයේ පුරාවිද්‍යාත්මක පසුබිම පිළිබඳ ව විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

එම්.සී. ප්‍රියදර්ශනී [15]

---

සබරගමු මහ සමන් දේවාලයේ ඉතිහාසය දඹදෙණි යුගය දක්වා අතීතයට දිවයයි. දෙ වැනි පරාක්‍රමබාහු රජුගේ මහ ඇමති විසින් මුල් වරට ඉදිකළා යැයි සැළකෙන මෙම විහාරය කෝට්ටේ පරාක්‍රමබාහු රාජ්‍ය කාලයේ දී අංග සම්පූර්ණ විහාරස්ථානයක් බවට පත් විය. ක්‍රි.ව 1618 දී පෘතුගීසි ආක්‍රමණවලින් විනාශ කරන ලද මෙම විහාරය වර්තමානයේ දක්නට ලැබෙන ආකාරයෙන් ගොඩනඟා ඇත්තේ මහනුවර යුගයේ දෙ වැනි රාජසිංහ රජු විසිනි. ඉතිහාසයේ පැතිකඩක් නිරූපණය කරන රත්නපුර මහ සමන් දේවාලයේ පුරාවිද්‍යාත්මක වටිනාකම් කෙතෙක් දුරට වර්තමානයේ පවතී ද යන්න අධ්‍යයනය මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුවයි. සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය හා ක්ෂේත්‍ර ගවේෂණය යන ක්‍රමවේද ඔස්සේ පුරාවිද්‍යාත්මක වටිනාකම සමාජ ගත කිරීම හා ජාතික පුරාවිද්‍යාත්මක වටිනාකම හඳුනාගැනීම වැදගත් වේ. සබරගමු මහ සමන් දේවාලයෙහි දැනට ඉතිරි ව ඇති පුරාවිද්‍යාත්මක නටඹුන් අතර පෘතුගීසී සමයට අයත් ශෛලමය ලාංඡන දෙකක්, පැරණි පෘතුගීසී කාලතුවක්කුවක්, සිංහල අකුරු සඳහන් සෙල්ලිපියක කැබලි තුනක්, ඇත් දළ යුගලක්, "**ඉර හඳ ගල**" නමින් හඳුන්වනු ලබන සඳකඩපහණ හා පැරණි උළුවස්සක් මේ අතර වේ. පෘතුගීසි සමයට අයත් ශෛලමය ලාංඡන දෙකෙන් එකක් රාජ්‍ය තාන්ත්‍රික ලාංඡනයකි. එය අඩි 1 යි අඟල් 6 ක් දිග, අඩි 1 ක් පළල, අඟල් 6 ක් පමණ ඝනකමකින් යුක්ත වේ. අනෙක් ලාංඡනය ශෛලමය පුවරුවක කෙටූ කැටයමක් බඳු චිත්‍රයක් සහ පෘතුගීසි බසින් ලියැවුණු සෙල්ලිපියකි. සිංහල යුධ සෙබළෙකු බිම දමා පයින් පාගා ගෙන සිටින පෘතුගීසි සෙන්පතියෙක් එම චිත්‍රයෙන් දැක් වේ. මෙම ශෛලමය පුවරුව අඩි 3 යි අඟල් 10 ක් දිග ය. අඩි 2 යි අඟල් 8 ක් පළල ය. දැනට එය දේවාලයේ පහත මාලෙහි කුරගෙයි වම් පස බැම්මට සවිකර තිබේ. පෘතුගීසී සමයට අයත් නටඹුන් අතර ඉපැරණි කාලතුවක්කුවක් ද වේ. මෙය එ කල සමන් දෙවොල වනසා එතැන ම හැදූ පෘතුගීසි යුධ කඳවුරෙන් ඉතිරි වූ වස්තුවක් බව විශ්වාස කෙරේ. මෙම කාලතුවක්කුවේ විශේෂත්වය වනුයේ එය අදටත් ක්‍රියාත්මක තත්ත්වයෙන් පැවතීම සහ පෙරහැර සමයේ දී තවමත් භාවිත කිරීම යි. දෙවොලට නඟින පඩිපෙළේ ආරම්භයේ ම ඇති සඳකඩපහණ දුර්ලභ ගනයේ එකක් බව පුරාවිද්‍යාත්මක අදහසයි. ශාන්ති මණ්ඩපයට පිවිසෙන ස්ථානයේ බිත්තියට සවිකල සෙල්ලිපි කැබලි කිපයකි. ඒවා හතර වැනි පරාක්‍රමබාහු රජු පිහිට වූ ශිලා ලේඛනයෙන් ඉතිරි වූ කොටසක් බව හඳුනාගෙන ඇත. සබරගමු මහ සමන් දේවාලය දුර්ලභවූත් විශේෂවූත් පුරාවස්තූන් රාශියකින් සමන්විත වන අතර ජාතික පුරාවිද්‍යාත්මක වටිනාකමට වැඩි දායකත්වයක් ලබා දෙයි.

ප්‍රමුඛ පදඃ සමන් දේවාලයේ ඓතිහාසිකත්වය, පුරාවිද්‍යාත්මක සාධක, ඉර හඳ ගල

---

[15] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, mcpriyadarshani123@gmail.com